## කවි කොළය

ලංකා විත්තියට......




යි!

තනි එක් අතක, තනි පෑනක බලය පිට
සැතපුම් දහස් ගණනක දුරු රටක සිට
සිංහළ සිංහ නාදය ඔබ නගන විට
ඇතිවන සතුට මෙතෙකැයි කිව නොහැක මට!

මගෙ කවි පෑන, මේ පසළොස් වසර පුරා
තෙලිතුඩ නමැති රන් අසිපත සුරත දරා
උරෙනුර පැහැර සිටියා කවි කොළය දරා
මගෙ සිත ඇදෙයි ඒ යටගිය යුගය කරා

දෙදරුම් කැවූ වන්නියෙ ගන වන බැද්ද
ඒ යුගයෙහිදි එල් ටීටී මහ යුද්ද
මැදහත් සිතින් දැන වරදද නිවැ රැද්ද
දුන්නෙමි පහර ගැලවී යන්නට රෙද්ද!

කවි කිවිඳියෝ සරසවි ගෙල උරෙහි රැඳී
රන්දම් පරිද්දෙන් බැබළෙති එළිය දිදී
නොනැවත ගලන ගඟ මෙන් යන පෙරට ඇදී
ලංකාවිත්ති ජයපිට ජය කෙහෙළි බැඳී!

එන විට එදා බිහිසුණු කොටි බලය පිපී
සංජය විමලරත්නගෙ පණගහන ලිපී
අසිපත් බවට පත්වී කොටි බලය කැපී
පිට පිට පහර දුන් අන්දම දුටිමු අපී

ලංකාවිත්තියේ පණ ඇති කතුවැකි ය
ඇස්වල රැඳුණු කොරපොතු ගලවන කෙකි ය
පුවතින් පුවත දකිනැකි ලොකු වෙනසකි ය
අන්තර්ජාලෙනුත් දැන් කියවිය හැකි ය!

ඉන්දුගෙ දිනපොතෙන් දෙන රස උප හාස
සමකළ හැකිය කටු රැඳි මලකට රෝස
දක්වයි ඇඟිල්ලෙන් ඈන දස මහ දෝස
රතුවන විහිළු ඇත සමහරෙකුගෙ දෑස

වල්පැල උගුළුවා ජාතිය නමැති කෙතේ
බිජුවට වපුළ නව සිතිවිලි අපගෙ සිතේ
ඔබ කළ මෙහෙය පැතුරුණි ලොව සියළු අතේ
ණය නැත! කිසි කළෙක නුඹ ජාතියට පුතේ!

පෑනය කුඩිටු මත බලයෙන් සිඳින කග
එය හෙළිකරයි ජාතික නිදහසට මග
පසළොස් වසක් තුළ ඔබ කළ මෙහෙය අග
ඉතිහාසයේ ලියැවෙයි රන්පතක දිග

පළවෙයි අලුත්
පෙර නොඇසුව විකට කතා
මේවා කෙසේ ගත්තෙද
රසමුසුව ගොතා?
ඔබ යන ගමන් මග
දැන් පැහැදිලිය ඉතා
නවතිම්! මෙයින්
ඔබ වෙත දිග් අසිරි පතා!



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka

# තවත් ලංකා තරුණ මවක් පෙට්ටියක ගෙදර එයි !

Island - SL
03/04/12



මිනෝලි ධර්මසේන

**ත**රුණ මිනෝලි ධර්මසේන මාස **11** කට පෙර මුදල් සොයන්නට බොහෝ ලාංකික කාන්තාවන් යන මැද පෙරදිග රටකට රැකියාව සඳහා ගියේ යහපත් සැපවත් අනාගතයක් තම ගෙදරට උදාකර දීමේ පරමාර්ථයෙනි. එහෙත් තමා ඉතා ටික කලකින්ම මිනීපෙට්ටියක් තුළ වැතිරී ආපහු උපන් බිමට පැමිණෙන්ට කිසිසේත් ඇය බලාපොරොත්තු වන්නට නැත.

අවිස්සාවේල්ලට නුදුරු කොස්ගම පදිංචි **24** වියැති මිනෝලි සිය සැමියාගේ ද අවසරය ඇතිව සවුදි අරාබියාවේ නිවසක ගෘහසේවිකාවක වශයෙන් රැකියාවක් කරන්නට ඒජන්සිකරුවෙකුගේ මාර්ගයෙන් පිටත්ව ගියාය. ඔවුන්ට වයස පහක පමණ පුතෙකුද සිටියේය. විශේෂයෙන් දරුවාට හොඳ අධ්‍යාපනයක් දෙන්නටද, හොඳ ගෙයක් දොරක් සාදා ගන්නටද එකම මග එවැනි රැකියාවකට යාම පමණ යයි ඇය සිතුවාය. එහෙත් ඇයගේ හදිසි අකල් මරණය ඒ සියලුම බලාපොරොත්තු සුන්කර දැමුවේ ය.



ශෝකයට පත්ව සිටන සැමියා සෙනරත් සහ එකම පුතා

මිනෝලිගේ මරණය ගැන ඇගේ සැමියා වන 27 හැවිරිදි සෙනරත් විජේරත්නට දැනගන්නට ලැබුණේ ඇය රැකියාව කළ ගෙදර කිසිවෙකු විසින් ඇයට පර දෙන ලදුව මිනෝලිගේ මරණය සිදුවූ බවයි. එහෙත් පසුව ඒ ගෙදරම සේවය කරන තවත් ශ්‍රීලාංකිකයෙකුගෙන් ඔහුට දැනගන්නට ලැබුණේ කිසිවෙකු තට්ටු හතරක් උඩ සිට ඇය පහළට තල්ලු කර ඇති බවයි.

තම බිරිඳගේ මරණය පිළිබඳව ලංකාවේ විදේශ රැකියා ආයතනයට තමා පැමිණිලි කළ බවත්, මිනෝලි රැකියාවට යාමට පෙර රක්ෂණය වී නැති බව ඔවුන් දැන්වූ බවත් සෙනරත් පවසයි.

“ මම කම්කරුවෙක්..... ගම කොටියාකුඹුර......මිනෝලි කොස්ගම........ බැඳලා දරුවා ලැබෙන්න ඉන්න අලුතම වගේ ඇයගේ ගෙදරට අපි පදිංචියට ආවා අගහිඟකම් බොහෝ තිබුණු නිසා........ මිනෝලි රස්සාවකට මැදපෙරදිග යන්න හිතුවෙ ඒ අගහිඟකම් මකාගන්න තිබුණු එකම පියවර යයි පෙනුණ නිසා........ ඒත් මේ වගේ දෙයක් වේවියයි අපි කවදාවත්ම හිතුවෙ නැහැ........”

පුතාද වඩාගෙන සෙනරත් ඉතා ශෝකයෙන් පවසයි.

## Another young mother comes home in a coffin !

Young girl, Minoli Dharmasena, who left Sri Lanka shores in search of greener pastures 11 months ago, would never have thought that she would return home in a coffin.

Minoli (24) a resident of Kosgama sought her husband's permission to go and work in Saudi Arabia as a domestic, since she had a lot of hopes for the future.

Her grieving husband Senarath Wijeratne (27) said that his wife thought of their little child's future and wanted to give him a good education and have their own home.

Senarath was informed that Minoli had been beaten by someone in the household where she worked. But later he received a call from one of her colleagues working in the same household that her death was caused due to the injuries she suffered after she had been pushed down from a four storey building.



**ඉරිදා** - **SUN** සවුදි අරාබියේ ගෙදරක වැඩටගිය එක්දරු තරුණ මවක් ඒ වැඩකරපු ගෙදර උඩ තට්ටුවකින් බිමට තල්ලුකරලා දාලා. ඊයෙ මිනිය ලංකාවට ගෙනාවා. ලංකාවෙ පාලකයො බලාගෙන ඉන්නෙ කවදා හරි අරාබිකාරයො ශීලාචාරවෙලා, පන්සිල් අරං, බෞද්ධයො බවට පත්වෙලා උන් දැන් කරන ඔක්කොම දහපරාදු අලුගුත්තේරු වැඩ නවත්තන දවසක එනකල්. එතකං මැරුම් කන්න වුනත් ඉවසගෙන ඉන්නය කියලයි අපේ ලොක්කො මැදපෙරදිග යන ලංකා ජනතාවට කියන්නෙ. මොකද රට දුවවන සල්ලි, විදේශ විනිමය සැහෙන ප්‍රමාණයක් හම්බ කරලා දෙන්නෙ ඒ අරාබි කරේට යන ගම්වල දුප්පත් මිනිස්සු නිසා. ලංකාවට වෙන හම්බ-කරලා දෙන්න කවුද ඉන්නෙ? කවුරුවත් නැහැ. කොළඹ ඉන්න හැමෝගෙම තියෙන්නෙ බොරු සෝබනේ විතරයි. ඒ සේරම කරන්නෙ අලි බොරුව.

**සඳුදා** - **MON** මේ දවස්වල ලංකාවෙ ටෙස්ට් ක්‍රිකට්. එංගලන්ත පිළ ගිහිල්ලා දැන් ඉන්නෙ එහේ. හැබැයි අපේ ජනතාව ඔක්කොම වගේ කියන්නෙ අපේ ක්‍රිකට් මණ්ඩලය ලංකාවෙ ක්‍රිකට් ක්‍රීඩාව මරලා දැම්මයි කියලා. මොකද දැන් ඒ මැච් එකක් බලන්න අඩුම ටිකට් එක රුපියල් **2000** යි. කාටද දෙදාහක් දීලා මැච් එකක් බලන්න යන්න සල්ලි තියෙන්නෙ? මෙහෙමද ක්‍රිකට් ක්‍රීඩාව ගමට ගෙනියනවයි කිව්වේ? අපේ රටේ ක්‍රිකට් ලොක්කො හඳෙන් ආපු ඇයොද? ඇයි මේ හූරගෙන කෑම? මේ දේවල් පාලනය කරන්න කෙනෙක් නැද්ද? වැඩ මෙහෙම නම්, මොකටද රට පුරාම ක්‍රිකට් පිට්ටනි හැදුවෙ? ඊට වැඩිය හොඳ නැද්ද ඒ ඉඩම් වල බතල මයියොක්ක හිටෙව්ව නම් ? ලංකාව මේ යන්නෙ කොහේද?

**කුජදා** - **TUE** යුද්දෙ තදට යන කාලෙ තලවකැලේ නැන්දම්මා මට කියපු දෙයක් මේ වෙලාවෙ මතක් වෙනවා.

“ දුවේ යුද්දෙට යන්නෙ ගම්වල ඉන්න අහිංසක දුප්පත් කොල්ලො විතරයි. කොළඹ ඉන්න ඔය එකෙක්වත් යුද්දෙට යන්නෙ නැහැ. උන් කරන්නෙ එයාර් කන්ඩිෂන් කාමරවල ඉඳගෙන කකුල්දෙක මේසෙ උඩට අරගෙන ටෙලිපෝන් එකේ වල්පල් කතාකරකර ඉන්න එක විත-රයි. කොළඹ ඉන්න එවුන්ට රෑට ඇවිදින්න යන්න, කාර් වල රවුම් ගහන්න, නයිට් ක්ලබ් යන්න, ක්‍රිකට් මැච් ගහන්න, ඒ සේරම දේවල් කරන්න ගම්වල ඉන්න දුප්පත් කොල්ලො ජීවිතේ දීලා, කොටින්ගෙන් රට බේරලා දෙන්න ඕන. හසලක ගාමිණීලා වගේ එකෙක් කොළඹ ඉන්නවද? නෑ.” නැන්දම්මගෙ කතාව සම්පූර්ණ ඇත්ත! දැන් මේ අපිට පේන්නෙ ඒවා තමයි!

**බුදදා** - **WED** ඇමති මර්වින් සිල්වා කට ඇරියොත් ඉවරයි. ලොකු විනාසයක් වෙලයි ඉවර වෙන්නෙ. ඒක නිසාද කොහේද මේ ළඟදි යූ ඇන්පිය කියලා තිබුණා මර්වින් ආණ්ඩුවෙ ඉන්න එක යූඇන්පියට ලොකු වාසියක් කියලා. ආණ්ඩුව නිකම්ම මිනිස්සුන්ට එපා වෙලා ඒ ගොල්ලන්ට බලේ ඒ විය කියලා තමයි ඒ පක්ෂය හිතා-ගෙන ඉන්නෙ. ඒ කතා මොනව වුනත් ඒ කියන දේවල් වල ලොකු තේරුමක් තියනවා. මර්වින් හන්දා මේ යුද්ධයක් දිනපු ආණ්ඩුවක් සවුත්තුවෙන එකටයි දුක. මර්වින් ගිය සතියේ ලෝකෙටම ඇහෙන්න කිව්වා ලංකාවෙ ලේඛකයන්ට ගහලා රටෙන් පන්නන්නෙ එයාය කියලා. ඒ කතාව අල්ජසීරා ටෙලිවිෂන් එකේ පෙන්නුවා. ඉතින් ජිනීවා සමුළුවෙ යුද අපරාධ ගැන ලංකාවට දොස් කියන එක වැරදිද ? චැනල් 4 කියන්නෙත් ඒකම නේද?

**ගුරුදා** - **THU** ලන්ඩන්වලට ඔලිම්පික් වාරය ගන්න එංගලන්තෙ පසුගිය රජයවල් පුදුම මහන්සියක් අරගෙන ඒ අවස්ථාවට තරඟකරපු අනික් රටවල් පරද්දන්න වැඩකරපු හැටි අපි දැක්කා. අන්තිමට ඒක හරි ගියා. ජූලි මාසෙ ඔලිම්පික් ලන්ඩන් වලට එනවයි කිව්වම අපි කවුරුත් සංතෝෂවුණා. නිහාල් ගිය අවුරුද්දෙ අපි හතර දෙනාට ටිකට් බුක්කරලා තිබුණ නිසා අපිට ටිකට් ලැබුණා. දැන් ටිකට් එකක්වත් හොයාගන්න නෑ. ඉන්ටර් නෙට් එකේ විකුණපු ටිකට් එකක් බොහොම අමාරුවෙන් ශාන්ත හොයාගත්තයි කිව්වා. ඒ එක ටිකට් එකට එයා පවුම් 540 ක් ගෙවලා. මගෙ අම්මෝ ! ලංකාවට ගිහිං එන්න එයාර්ටිකට් එකට යන වියදම නේ ඒ. එහෙම කිව්වම ශාන්ත කිව්වා කමක් නෑ මට ජීවිතේට එක සැරයක්වත් ඔලිම්පික් දැක්ක නම් ඒ ඇති කියලා.

**කිවිදා** - **FRI** ලංකාව ඉන්දියාවට තාම බනිනවා අර කරපු කැත වැඩේට. ඉන්දියාවෙ පත්තරත් ඉන්දියාවට පලූ යන්න බැනලා තිබුණා ඇයි ලංකාවට විරුද්ධව ඡන්දෙ දුන්නෙ කියලා. ඉන්දියාව මහ දෙපිටකාට්ටු රටක් බව මම නම් මුල ඉඳලම දැනගෙන හිටියා. ඒ රටේ ඉන්නෙ හිනා වෙලා හොඳ මූණ පෙන්නලා හෙමිහිට පස්සට පිහියෙන් අනින උදවිය. වැඩිය ඕන නෑ....ඉන්දිරා ගාන්ධි අපේ බණ්ඩාරනායක මැතිණියගෙ හොඳම යෙහෙළිය වෙලා ඉඳලා සද්දනැතුව එල්ටීටීඊ කොටින්ට ඉන්දියාවෙ ඇතුළෙ හොරෙන් කැම්ප් දාලා දුන්නා. පුහුණුවෙලා ගිහිං ලංකාවට ගහපියව් කියලා. ඉන්දියාවෙ එකෙක් නෑ හොඳ. හිටපු එකම හොඳ කෙනා බුදුහාමුදුරුවො විතරයි!